සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

**ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I**
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

**49 S I**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** රෝම නගරය හරහා ගලා යන ගංගාව වනුයේ,
(1) ටයිබර් ය. (2) රයින් ය. (3) ඩැනියුබ් ය.
(4) යුප්‍රටීස් ය. (5) ටයිග්‍රීස් ය.

**2.** 'වල්ගේට්' යන බයිබලයේ පරිවර්තනය ලියැවී ඇති භාෂාව වන්නේ,
(1) ග්‍රීක් ය. (2) ෆිනීෂියන් ය. (3) ඊජිප්තු ය. (4) සිරියානු ය. (5) ලතින් ය.

**3.** පුරාණ රෝමයේ විසූ ජනයාගේ බහුතරය වූයේ,
(1) පැට්‍රීෂියානුවෝ ය. (2) ප්ලේබියන්වරු (පිලේෂියන්වරු) ය.
(3) නපෝලිතානුවෝ ය. (4) ෆ්ලොරොන්සියානුවෝ ය.
(5) වෙනීසියානුවෝ ය.

**4.** විනයධරයන් අතුරෙන් පළමුවැන්නා ලෙස සලකනු ලබන්නේ මින් කවරෙක් ද?
(1) නෙහෙමියා (2) සදොක් (3) දානියෙල් (4) එසකියෙල් (5) එස්රා

**5.** රතු මුහුද පිහිටියේ ඊජිප්තුවට කුමන දිශාවෙන් ද?
(1) බටහිර (2) උතුරු (3) නැගෙනහිර (4) දකුණු (5) අග්නිදිග

**6.** පහත ප්‍රකාශ සලකන්න.
A - මධ්‍යධරණී වෙරළබඩ පිහිටි වරායකි.
B - මෙම ප්‍රදේශයෙහි මකබිවරුන් සහ ග්‍රීකයන් අතර යුද්ධයක් තිබිණි.
C - ගිහොන් නදිය මෙම ප්‍රදේශයෙන් ගලා බසියි.
D - ශුද්ධවූ පාවුලුතුමාගේ තෙවන ධර්මදූත ගමනේ දී මෙම ප්‍රදේශය බැහැදැක ඇත.
E - මෙම ප්‍රදේශය බටහිර කඳුකරය සහ වෙරළ තීරය අතර පිහිටා ඇත.

මේ අතුරෙන් අක්කෝ තැනිතලාව පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**7.** පලස්තීනයේ නැගෙනහිර කඳු පිහිටි ප්‍රදේශ ඇතුළත් වරණය කුමක් ද?
(1) ගලීලය, සමරියාව සහ ජුදයාව
(2) ගලීලය, සමරියාව සහ අම්මොන්
(3) නෙගෙබ්, හේබ්‍රෝන් සහ කාර්මෙල්
(4) බාෂාන්, අම්මොන් සහ මොවාබ්
(5) ඒදොම්, මොවාබ් සහ හේබ්‍රෝන්

**8.** බෙත්ලෙහෙම පිහිටියේ මින් කුමන නගරය අසල ද?
(1) ජෙරුසලම (2) ගාසා (3) ජෙරිකෝව (4) තිබේරියස් (5) හේබ්‍රෝන්

Past Papers Wiki



**9.** පහත ප්‍රකාශ සලකන්න.

A - වයස අවුරුදු 16 දී පිරිමින්ට විවාහවීමට අවසර තිබිණි.
B - වයස අවුරුදු 12 දී කාන්තාවන්ට විවාහවීමට අවසර තිබිණි.
C - විවාහ ගිවිසගැනීමෙන් වසරකට පසු විවාහ මංගල්‍යය පැවැත්විණි.
D - ස්වාමිපුරුෂයාට සිය භාර්යාව දික්කසාද කිරීමේ අවසරය තිබිණි.
E - භාර්යාවට සිය ස්වාමිපුරුෂයා දික්කසාද කිරීමේ අවසරය තිබිණි.

මේ අතුරෙන් පුරාණ ඊශ්‍රායෙලයේ විවාහය පිළිබඳ නිවැරදි ප්‍රකාශ දැක්වෙන වරණය තෝරන්න.

(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, C සහ E (5) C, D සහ E

**10.** මහා හෙරෝද් රජ පැමිණියේ,

(1) ගලීලයෙනි. (2) ෆිනීෂියාවෙනි. (3) සිරියාවෙනි.
(4) ඒදෝම් දේශයෙනි. (5) මොවාබ් දේශයෙනි.

**11.** පහත ප්‍රකාශ සලකන්න.

A - පාස්කු මංගල්‍යය නිසාන් මස සිදුකරන ලදී.
B - කූඩාරම් මංගල්‍යය 'සති මංගල්‍යය' යනුවෙන් හඳුන්වන ලදී.
C - පෙන්තකොස්ත මංගල්‍යය 'සුක්කොත්' යැයි හඳුන්වන ලදී.
D - පෙන්තකොස්ත මංගල්‍යය අස්වනු මංගල්‍යයක් විය.
E - 'යෝම් කිප්පූර්' යනුවෙන් හඳුන්වන ලද්දේ පාප පූජා මංගල්‍යයයි.

මේ අතුරෙන් පුරාණ ඊශ්‍රායෙලයේ මංගල්‍යයන් පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B සහ C ය. (2) A, D සහ E ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**12.** මහා ඇලෙක්සැන්ඩර් රජුගෙන් පසු පලස්තීනය පාලනය කළේ කවුද?

(1) ඇන්ටියෝකස් එපිපානෙස් (2) පොම්පේ (3) අර්කේලාවුස්
(4) ටොලමි (5) හෙරෝද් ඇන්ටිපස්

**13.** සෙන්හෙඩ්‍රිනය (ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය) පිළිබඳ නීති අඩංගු ග්‍රන්ථය වනුයේ,

(1) නික්මයාම පොත ය. (2) ද්විතීය නීති සංග්‍රහය ය. (3) ප්‍රඥා පොත ය.
(4) ටොසෙෆ්ටා ය. (5) මිෂ්නා ය.

**14.** නව ගිවිසුම ලියැවුණු මුල් භාෂාව කුමක් ද?

(1) ලතින් (2) ඇරමයික් (3) ග්‍රීක් (4) සිරියන් (5) ඉතියෝපියන්

**15.** ජුදාවරුන්ගේ සිත් දිනාගැනීම අරබයා ජෙරුසලම් දේවමන්දිරය ප්‍රතිසංස්කරණය කළ රජතුමා කවුරුන් ද?

(1) මහා හෙරෝද් (2) මහා ඇලෙක්සැන්ඩර් (3) සයිරස්
(4) නෙබුකද්නසාර් (5) හෙරෝද් ඇන්ටිපස්

**16.** පහත ප්‍රකාශ සලකන්න.

A - ඔහු සිනගෝගයේ පවත්වන ලද නමස්කාරයට සහභාගි විය.
B - ඔහු යාච්ඤා කිරීමට ඉගෙනගත්තේ ශුද්ධ වූ ගීත ඇසුරෙනි.
C - ඔහු හෙරෝද් රජුගේ යදම්වලින් ජොහාන් බේරාගැනීමට ප්‍රයත්න දැරුවේ ය.
D - ඔහු ගලීල සිනගෝගයේ නීතිය (ටෝරා) හැදෑරී ය.
E - ඔහු ජෙරුසලෙම් දේව මාලිගාවේ වන්දනාවට ගිය සේක.

මේ අතුරෙන් නාසරතයේ ජේසුස්වහන්සේ පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**17.** නාසරෙත්හි ධර්මශාලාවේ දී ජේසුස්වහන්සේ සිදුකළ ප්‍රථම දේශනයේ දී උපුටා දක්වන ලද දිවැසිවර ග්‍රන්ථය වන්නේ,

(1) ජෙරමියා ය. (2) යෙසායා ය. (3) එසකියෙල් ය. (4) හොසියා ය. (5) මලාකි ය.

**18.** මතෙව් සුබාරංචියේ එන කන්ද උඩ දේශනාවේ සඳහන් ජුදා ආගමික අභ්‍යාස තුන මොනවා ද?

(1) යාච්ඤාව, දන්දීම, උපවාසය (2) යාච්ඤාව, උපවාසය, මර්දන ක්‍රියා
(3) යාච්ඤාව, මර්දන ක්‍රියා, දන්දීම (4) දන්දීම, උපවාසය, භාවනාව
(5) දන්දීම, උපවාසය, මර්දන ක්‍රියා

**19.** යහපත් සමරිතානුවරයාගේ උපමාව සඳහන් වන්නේ,
(1) මතෙව් සුබාරංචියේ ය. (2) මාක් සුබාරංචියේ ය.
(3) ලූක් සුබාරංචියේ ය. (4) හෙබ්‍රෙව් ලිපියේ ය.
(5) ජාකොබ් ලිපියේ ය.

**20.** "ඉන්පසු සකල මනුෂ්‍යයන් කෙරෙහි මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරමි." (ජෝවෙල් 2:28-32) යන දිවැස්වැකිය සම්පූර්ණ වූයේ,
(1) ජේසුස්වහන්සේගේ බෞතීස්මයේ දී ය.
(2) කානාහි විවාහ මංගල්‍යයේ දී ය.
(3) ජේසුස් වහන්සේ අන්‍යරූපවිලාශවීමේ දී ය.
(4) ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානයේ දී ය.
(5) පෙන්තකෝස්ත දිනයේ දී ය.

**21.** පහත ප්‍රකාශ සලකන්න.
A - ජේසුස්වහන්සේ මෙසියස් ය.
B - ජුදයන් විසින් ජේසුස්වහන්සේව කුරුසයේ ඇණගසා මරණයට පත්කරන ලදී.
C - ජේසුස්වහන්සේ තුන්වනදා මරණයෙන් උත්ථාන වූ සේක.
D - ජේසුස්වහන්සේ තම මරණය සහ උත්ථානය ගැන ගෝලයන්ට ප්‍රකාශ කළ සේක.
E - ජේසුස්වහන්සේ උපමා මගින් ජනයාට ඉගැන්වූ සේක.
මේ අතුරෙන් පෙන්තකෝස්ත දිනයේ ශුද්ධවූ පේද්‍රුතුමා සිදුකළ පළමු දේශනයෙහි අඩංගු ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**22.** අන්තියෝකියේ ක්‍රිස්තියානි සභාව ආරම්භ කිරීමට ශුද්ධවූ පාවුලුතුමාව කැඳවාගෙන යනු ලැබුවේ කවුරුන් ද?
(1) පේද්‍රුතුමා (2) තිමති (3) ලූක් (4) බර්ණබස් (5) අනනියස්

**23.** ශුද්ධවූ පාවුලුතුමාගේ දෙවන ධර්මදූත චාරිකාවට එක්වූ ශ්‍රාවකයන් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ලූක්, මාක්, බර්ණබස් (2) ලූක්, තිමති, මාක්
(3) සීලස්, තිමති, ලූක් (4) තිමති, තීතස්, ලූක්
(5) සීලස්, බර්ණබස්, ලූක්

**24.** ශුද්ධවූ පාවුලුතුමාව නිවාස අඩස්සියේ තබන ලද්දේ,
(1) රෝමයේ ය. (2) මෝල්ටාවේ ය. (3) එපීසයේ ය.
(4) කොරින්තියේ ය. (5) අන්තියෝකියේ ය.

**25.** රෝම අධිරාජ්‍යයන් රාජ්‍යත්වයට පත් වූ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
(1) නීරෝ, මාකස් අවුරේලියස්, අවුරේලියන්, ට්‍රාජන්
(2) අවුරේලියන්, නීරෝ, ට්‍රාජන්, මාකස් අවුරේලියස්
(3) නීරෝ, ට්‍රාජන්, මාකස් අවුරේලියස්, අවුරේලියන්
(4) මාකස් අවුරේලියස් , නීරෝ, අවුරේලියන්, ට්‍රාජන්
(5) ට්‍රාජන්, මාකස් අවුරේලියස්, නීරෝ, අවුරේලියන්

**26.** 'සත්‍යයේ ආරක්ෂකයෝ' ලෙස හැඳින්වූ සභා පියවරු පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට්, ඔරිගන්, ඉරේනියස්, ජස්ටින්
(2) ඔරිගන්, ජස්ටින්, ටර්ටූලියන්, බැසිල්
(3) ජස්ටින්, ටර්ටූලියන්, ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල්, ඔරිගන්
(4) ටර්ටූලියන්, ග්‍රෙගරි, අතනාසියුස්, ඒරියස්
(5) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට්, ඔරිගන්, ජස්ටින්, ටර්ටූලියන්

**27.** පහත සඳහන් ඒවා අතුරෙන් නිවැරදි යුගලය තෝරන්න.
(1) ප්ලේටෝ - ස්ටොයික්වාදය
(2) ජෙරම් - වල්ගේට්
(3) සෙනෝ - නොස්ටික්වාදය
(4) වැලන්ටීනස් - සෙප්ටුවාජින්ත
(5) එව්සේබියස් - ප්ලොටොනිකවාදය

Past Papers Wiki



28. ක්‍රිස්තියානි තාපස ජීවිත ක්‍රමයේ ආරම්භකයා වූයේ,
(1) ශු. ජෙරොම් ය.
(2) ශු. පැකෝමියස් ය.
(3) ඊජිප්තුවේ ශු. ඇන්තනි ය.
(4) ශු. බැසිල් ය.
(5) ශු. අගොස්තීනු ය.

29. පහත ප්‍රකාශ සලකන්න.
A - ජෝබ්ගේ දුක්ඛිත ජීවිතය
B - ජේසුස්වහන්සේ පාලුකරයේ නිරාහාරශීල වීම
C - දානියෙල්ගේ දර්ශන සහ පැහැදිලි කිරීම්
D - ස්නාවක ජොහාන්ගේ පාලුකරයේ ජීවිතය
E - එලියා දිවැසිවරයාගේ ජීවිතාංග
මේ අතුරෙන් මුල්කාලීන තාපස දිවිය කෙරෙහි ආභාස ලැබූ බවට සලකනු ලබන ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය. (4) B, C සහ D ය. (5) B, D සහ E ය.

30. එංගලන්තයේ, ස්කොට්ලන්තයේ, අයර්ලන්තයේ සහ ජර්මනියේ අපෝස්තුලුවරුන් පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) මහා ග්‍රෙගරි, කොලම්බා, පැට්‍රික්, බොනිපස්
(2) කොලම්බා, පැට්‍රික්, මහා ග්‍රෙගරි, බොනිපස්
(3) මහා ග්‍රෙගරි, බොනිපස්, පැට්‍රික්, කොලම්බා
(4) පැට්‍රික්, බොනිපස්, කොලම්බා, මහා ග්‍රෙගරි
(5) බොනිපස්, මහා ග්‍රෙගරි, පැට්‍රික්, කොලම්බා

31. යුරෝපීය විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අනාගත ගමන්මග සකස් කළ පැවිදි නිකාය වන්නේ මින් කුමක් ද?
(1) ජේසු නිකාය
(2) දොමිනිකානු නිකාය
(3) බෙනදික්ත නිකාය
(4) අගොස්තීනියානු නිකාය
(5) සැලේසියානු නිකාය

32. පහත ප්‍රකාශ සලකන්න.
A - පාලකයන් පත්කිරීම
B - ජාතීන් යටත්කර ගැනීම
C - නව ව්‍යාපාරයන්හි නිරතවීම
D - සොල්දාදුවන් ශක්තිමත් කිරීම
E - මුදල් සහ දේපළ රැස්කිරීම
මේ අතුරෙන් අඳුරු යුගයේ සභාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය. (4) A, D සහ E ය. (5) B, C සහ D ය.

33. බෙනදික්තනු නිකායික පාසල්වල උගන්වන ලද විෂයයන් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) බයිබලය, පුරාණ ග්‍රීක සාහිත්‍යය සහ ජනවන්දනාමය ලේඛන
(2) බයිබලය, සම්භාව්‍ය ලතින් සාහිත්‍යය සහ සභා පියවරුන්ගේ ලේඛන
(3) බයිබලය, දේවධර්මය සහ සම්භාව්‍ය ලතින් සාහිත්‍යය
(4) බයිබලය, සභා පියවරුන්ගේ ලේඛන සහ යුරෝපීය ඉතිහාසය
(5) බයිබලය, පුරාණ ග්‍රීක සාහිත්‍යය සහ රෝම අධිරාජ්‍යවරුන්ගේ ඉතිහාසය

34. තෙවන කුරුස යුද්ධයට සහභාගී වූ එංගලන්තයේ රජු වනුයේ,
(1) පළමුවන එඩ්වඩ් ය.
(2) හත්වන ලුවී ය.
(3) දෙවන ෆෙඩ්රික් ය.
(4) පළමුවන රිචඩ් ය.
(5) දෙවන පිලිප් ය.

**35.** පහත ප්‍රකාශ සලකන්න.

A - සාමාජිකයන් මූලික උපාධියක් ලබා තිබිය යුතු විය.
B - ශු. වින්සෙන්ති පාවුලු විසින් ආරම්භ කරන ලදී.
C - විශ්වවිද්‍යාල නගරයන්හි පැවිදි නිවාස පිහිටුවන ලදී.
D - පදවි පූජක කණ්ඩායමක් ආරම්භ කළේ ය.
E - විශේෂ අරමුණ වූයේ දකුණු ප්‍රංශයේ ග්‍රාමයන්හි දුප්පතුනට සේවය කිරීමයි.

මේ අතුරෙන් වින්සෙන්තියානු සභාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය. (4) B, C සහ D ය. (5) B, D සහ E ය.

**36.** ශු. ඇන්සගාර්තුමාගේ අධ්‍යාපනික දූත මෙහෙවරෙන් ප්‍රතිලාභ ලැබූ රටවල් වන්නේ,
(1) ජර්මනිය සහ ඩෙන්මාර්කයයි.
(2) ඩෙන්මාර්කය සහ ස්කොට්ලන්තයයි.
(3) ස්වීඩනය සහ ඩෙන්මාර්කයයි.
(4) එංගලන්තය සහ ස්වීඩනයයි.
(5) අයර්ලන්තය සහ ස්වීඩනයයි.

**37.** ක්‍රි.ව 538 දී විවියර්ස් (විවේරියම්) හි පිහිටි තාපසාරාමයක් මීසම් පාසලක් බවට පත් කරන ලද්දේ,
(1) කැන්ටබරියේ අගොස්තීනු ය.
(2) සියෝඩරස් ය.
(3) අයර්ලන්තයේ පැට්‍රික් ය.
(4) ශුද්ධවූ බොනිපස් ය.
(5) ශුද්ධවූ ජෙරොම් ය.

**38.** මීසම් පාසල්වල උගන්වන ලද ප්‍රධාන විෂයයන් ඇතුළත් වරණය කුමක් ද?
(1) ක්‍රිස්තියානි ජීවිතය, ජනවන්දනාව සහ සංගීතය
(2) සංගීතය, දර්ශනය සහ ජනවන්දනාව
(3) දේවධර්මය, දර්ශනය සහ ජනවන්දනාව
(4) නීතිය, ජ්‍යාමිතිය සහ සංගීතය
(5) ක්‍රිස්තියානි ජීවිතය, දේවධර්මය සහ ජනවන්දනාව

**39.** බොලොඤ්ඤා විශ්වවිද්‍යාලයේ ස්වාභාවික නීතිය පිළිබඳ ඉගැන්වීම දිරිගැන්වූ දාර්ශනිකයා වූයේ,
(1) ඇරිස්ටෝටල් ය.
(2) ප්ලේටෝ ය.
(3) ශුද්ධවූ බර්නාඩ් ය.
(4) පියෙත්‍රෝ පොම්පොනාසි ය.
(5) එම්මානුවෙල් කාන්ට් ය.

**40.** පහත ප්‍රකාශ සලකන්න.

A - ඉතාලි භාෂාවේ පියා විය.
B - වසර 70ක් තාපසාරාමයක ප්‍රධානියා ලෙස සේවය කළේ ය.
C - 'ක්‍රිස්තුස් අනුසාරය' ග්‍රන්ථයෙහි කර්තෘ ය.
D - 'ආත්ම පරිත්‍යාගය' ග්‍රන්ථය මගින් අධ්‍යාත්මික ජීවිතය අලුත් කළේ ය.
E - දිනපතා දිව්‍ය සත්ප්‍රසාදය ලබාගනිමින් යහපත් ලෙස ජීවත්වීමට මිනිසුන්ට මගපෙන්වී ය.

මේ අතුරෙන් තෝමස් අකම්පේ සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය. (4) B, C සහ D ය. (5) B, C සහ E ය.

**41.** පහත ප්‍රකාශ සලකන්න.

A - රවුම් හෝ ගෝලාකාර හැඩැති දේවස්ථාන ව්‍යුහය
B - දේවස්ථාන මධ්‍යයෙහි මුළුමනින් කුලුණු හෝ බිත්ති නොමැත
C - ග්‍රීක කුරුසයේ හැඩයෙන් යුතුව ඉදිකිරීම
D - උල්වූ හෝ තියුණු ආරුක්කු සහිත ව්‍යුහය
E - පැතලි වහලක් වෙනුවට අර්ධ වෘත්තාකාර වහල ව්‍යුහය

මේ අතුරෙන් බයිසෙන්තියානු දේවස්ථාන සැකැස්ම සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය. (4) A, C සහ D ය. (5) B, C සහ D ය.

**42.** ඔරතෝරියානු සංගීතයේ පුරෝගාමියකු වූයේ,
(1) පෙරොටින් ය.
(2) I ග්‍රෙගරි පාප්වහන්සේ ය.
(3) XII පියුස් පාප්වහන්සේ ය.
(4) ජෝර්ජ් පැට්‍රික් ය.
(5) ලුඩ්විග් වැන් බිතෝවන් ය.

**43.** චීන පුරාණ ජනකතා ඇසුරෙන් මැවීමේ කථා පැහැදිලි කරන ලද්දේ කවරෙක් ද?
(1) මතෙඕ රිචි පියතුමා (2) ජුසේ වාස් පියතුමා
(3) කොස්මේ ඩී ටොරෙස් පියතුමා (4) පිලිප් බල්දේයස් පියතුමා
(5) රොබට් ඩී. නොබිලි පියතුමා

**44.** ජපානයෙන් ක්‍රිස්තියානි දහම තහනම් කරමින් ජේසු නිකායික පියවරුන් පිටුවහල් කරන ලද්දේ,
(1) 1597 දී ය. (2) 1612 දී ය. (3) 1817 දී ය. (4) 1861 දී ය. (5) 1973 දී ය.

● අංක **45** සහ **46** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත වගුවෙහි තොරතුරු යොදාගන්න.

| | | | |
|---|---|---|---|
| A - ලබොරෙම් එක්සර්චෙන්ස් | B - බූසාන්, දකුණු කොරියාව | C - සිංගප්පූරුව | D - දේවුස් කරිතාස් එස්ට් |
| E - මාතර් එට් මජිස්ට්‍රා | F - 1973 වර්ෂය | G - 2013 වර්ෂය | H - සොලිසිටුඩෝ රෙයි සෝෂලිස් |

**45.** II ජුවාම් පාවුලු පාප්වහන්සේ හා සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ E ය. (2) A සහ H ය. (3) B සහ C ය. (4) C සහ H ය. (5) D සහ E ය.

**46.** ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය හා සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ F ය. (2) A සහ G ය. (3) B සහ E ය. (4) C සහ F ය. (5) D සහ H ය.

**47.** වෙල්ලස්ස-බුත්තල ප්‍රදේශයේ අසරණ ජනතාවගේ ජනජීවිතය නගාසිටුවමින් ද, පරිසරය ආරක්ෂා කිරීමට මගපෙන්වමින් ද, සාධාරණත්වය සම්බන්ධව ඔහු සිටි ස්ථාවරය හේතුවෙන් ඝාතනයට ලක්වූ පියතුමා වූයේ,
(1) ගරු පීටර් පිල්ලේ පියතුමා ය.
(2) ගරු මේරි බැස්ටියන් පියතුමා ය.
(3) ගරු චන්ද්‍ර ප්‍රනාන්දු පියතුමා ය.
(4) ගරු ජෝන් හර්බට් පියතුමා ය.
(5) ගරු මයිකල් රොද්‍රිගු පියතුමා ය.

**48.** චෙන්ටිසිමුස් අන්නුස් (Centisimus Annus) ප්‍රකාශනය (විශ්වලේඛනය) නිකුත්කරන ලද්දේ කුමන ප්‍රකාශනයක සියවස් සැමරුම නිමිත්තෙන්ද?
(1) රේරුම් නොවාරුම් (Rerum Novarum)
(2) මාතර් එට් මජිස්ට්‍රා (Mater et Magistra)
(3) පාචෙම් ඉන් ටෙරිස් (Pacem in Terris)
(4) ලබොරෙම් එක්සර්චෙන්ස් (Laborem Exercens)
(5) පොපියුලොරුම් ප්‍රෝග්‍රෙසියෝ (Populoram Progressio)

**49.** ලෝක කිතුනු සභා සම්මේලනය (WCC) නිල වශයෙන් ස්ථාපිත කිරීම සඳහා ඒකාබද්ධ කරන ලද පෙරමුණු/ව්‍යාපාර ද්වය වූයේ,
(1) 'ජාත්‍යන්තර මිෂනාරි සංගමය' සහ 'ලෝක ධර්මෝපදේශ සභාව' ය.
(2) 'ලෝක මිෂනාරි සමුළුව' සහ 'ජීවිතය හා සේවය' ය.
(3) 'විශ්වාසය හා පිළිවෙළ' සහ 'ජීවිතය හා සේවය' ය.
(4) 'විශ්වාසය හා පිළිවෙළ' සහ 'බැප්ටිස්ට් සභාව' ය.
(5) 'රෝමානු කතෝලික සභාව' සහ 'ලෝක මිෂනාරි සමුළුව' ය.

**50.** පහත සඳහන් ඒවා අතුරෙන් නිවැරදි යුගලය තෝරන්න.
(1) බොන්ජින් රදගුරුතුමා - ගාල්ල පදවිය
(2) ජෝන් සී. සාගෝ - මන්නාරමේ ප්‍රාණපරිත්‍යාගිවරුන්
(3) ජාකෝමේ ගොන්සාල්වෙස් - ශ්‍රී ලංකාවේ පළමු ඔරතෝරියානු පියතුමා
(4) ලියෝ නානායක්කාර රදගුරුතුමා - ලතින් ජනවන්දනාව
(5) ස්වාමි ඥානප්‍රකාසර් - ජේසු නිකායික පියතුමා

***

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

**ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II**
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

**49 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | - | **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ජේසුස්වහන්සේගේ කාලයේ සිටි ජුදා ආගමික කණ්ඩායම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) ශිෂ්ටාචාරයක පවතින ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) ඊශ්‍රායෙලයේ දියුණුව උදෙසා දාවිත් රජතුමාගේ දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) පුරාණ ඊශ්‍රායෙලයේ වහලුන්ගේ තත්ත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 08යි)

**2.** (i) මුල් ක්‍රිස්තියානි යුගයේ පැවති ග්‍රීක දර්ශන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) දේවරාජ්‍යය පිළිබඳ ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් **හතරක්** ලැයිස්තුගත කරන්න. (ලකුණු 04යි)

(iii) ජේසුස්වහන්සේගේ ප්‍රාතිහාර්යයන් 'දේවරාජ්‍යයේ සලකුණු' ලෙස ක්‍රියාකරන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) ශුද්ධවූ පාවුලුතුමා සිය ධර්මදූත චාරිකාවල දී මුහුණදුන් අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**3.** (i) යාචක තාපස නිකායන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) ලියනාඩෝ ඩාවින්චිගේ දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) කැතීඩ්‍රල් පාසල් මගින් අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) ඇංග්ලිකන් සභාවේ ආරම්භය සහ දූත මෙහෙවර සාකච්ඡා කරන්න. (ලකුණු 08යි)

PAST PAPERS WIKI

[දෙවැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

## II කොටස

**4.** (i) සීනායි ගිවිසුම විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ශ්‍රී ලාංකේය කිතුනුවන් සිය සභාවන්හි ඉගැන්වීම් අනුගමනය කරමින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ සෙනඟක් ලෙස සාක්ෂි දැරිය හැක්කේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

**5.** (i) ප්‍රේමය අනෙක් සියලු ගුණාංග සහ ආත්මික දීමනාවලට වඩා උතුම්බව ශුද්ධවූ පාවුලුතුමා උගන්වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ශ්‍රී ලංකාවේ විවිධ ආගමික ලබ්ධිකයන් අතර ආගමික සහජීවනය සහ අන්‍යෝන්‍ය ගෞරවය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රේමය සහ පරිත්‍යාගය පිළිබඳ ශුද්ධවූ පාවුලුතුමාගේ ඉගැන්වීම් ආදර්ශයක් කරගත හැක්කේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

**6.** (i) මධ්‍යතන යුගයේ දොමිනිකානු පැවිදි නිකායේ ආරම්භය සහ දූත කාර්යය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) සිසුන් අතර පාරිසරික සවිඥානිකත්වය ප්‍රවර්ධනය කිරීමට, ක්‍රිස්තියානි අධ්‍යාපනය දායක විය හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**7.** (i) පුනරුද සමයේ රෝමානු කතෝලික සභාව නවෝදයක් කරා ගෙන ඒමට ජේසු නිකායෙන් ලැබුණු දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) අසත්‍ය ඉගැන්වීම්වලින් සහ නූතන සමාජ අක්‍රමිකතාවලින් ලෝකය පිරී පවතින තත්ත්වය හමුවෙහි වර්තමානයේ සභා නායකයින්ගේ දූත මෙහෙවර සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

**8.** (i) සාමය සහ සහජීවනය පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) වර්තමාන ගෝලීය ආතතිමය තත්ත්වයන් සහ යුදගැටුම් හමුවෙහි ක්‍රිස්තියානි සභාවේ කාර්යභාරය සහ කිතුනුවන්ගේ වගකීම් සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library